කලාප අධ්‍යාපන කාර්යාලය - රත්නපුර

බහුවරණ ප්‍රශ්න සංග්‍රහය

විෂය- සාමාන්‍ය තොරතුරු තාක්ෂණය

සකස් කළ ගුරුභවතාගේ නම - ආර්.ඒ.ඩිලක්ෂිකා ඉඳුනිල් රූපසිංහ

පාසල - ර/පත්බේරිය නාරද ම.ම.වි.

ශ්‍රේණිය - 12

පාඩම - 3

## 3 ඒකකය - මෙහෙයුම් පද්ධති පිළිබඳව අවබෝධය මගින් පරිගණකය කාර්යක්ෂම හා ඵලදායි අයුරින් භාවිතා කරයි.

1. පරිගණකය පණ ගැන්වීම ආරම්භයේදී (beginning of booting up process)දෘඩාංග පරික්ෂා කිරීම සහ ඒවා නිවැරදිව ක්‍රියාත්මක වේ දැයි සොයා බැලෙන පළමු වැඩසටහන වන්නේ

   1) POST
   2) Bootstrap loader
   3) CMOS
   4) booting

2. CMOS Acronym හි නිවැරදි ප්‍රසාරණය වන්නේ

   1) Complementary Metal Oxide Semi-Conductor
   2) Computer Memory Operating System
   3) Computer Management Organization System
   4) Complementary Memory Organization System

3. ස්ථිරාංග (Firmware) ....................................මුලින්ම ක්‍රියාත්මක වන මෘදුකාංගය වේ. මෙහි හිස්තැනට ගැළපෙන්නේ

   1) යම් යෙදුම් මෘදුකාංගයක් (application) විවෘත කළ විට
   2) පරිගණකය පණ ගැන්වූ (switch on)විට
   3) පරිගණකය වසා දැමූ (shut down)විට
   4) පරිගණකයට ප්‍රවේශ (login)වූ විට

4. පහත සඳහන් ඒවායින් විවෘත කේත ()මෙහෙයුම් පද්ධතිය වන්නේ

   1) DOS
   2) Windows Vista
   3) Isuru Linux

4) Macintosh

5. පරිශීලක(user) සහ පරිගණක දෘඩාංග (computer system) අතර සම්බන්ධතාවය පහත රූප සටහනින් දැක්වේ.මෙහි A, B අක්ෂර වලින් දැක්වෙන්නේ පිළිවෙලින්

| | |
|---|---|
| පරිශීලක | |
| A | |
| B | උපයෝගිතා මෘදුකාංග |
| දෘඩාංග | |

1) මෙහෙයුම් පද්ධතිය (Operating System), යෙදුම් මෘදුකාංග (Application Software)

2) උපයෝගිතා මෘදුකාංග (Utility Software),පැකේජ (Packages)

3) පැකේජ(Packages) , උපයෝගිතා මෘදුකාංග ((Utility Software)

4) යෙදුම් මෘදුකාංග(Application Software), මෙහෙයුම් පද්ධතිය (Operating System)

6. linux, ubuntu, MS DOS සහ ගණක යන්ත්‍ර අයත් වන මෙහෙයුම් පද්ධති වර්ග පිළිවෙලින් දැක්වෙන වරණය වන්නේ

බහු කාර්ය, ඒක පරිශීලක, තත්‍ය කාල,බහු පරිශීලක

ඒක පරිශීලක, බහු කාර්ය, බහු පරිශීලක, තත්‍ය කාල

බහු පරිශීලක, බහු කාර්ය, ඒක පරිශීලක, තත්‍ය කාල

තත්‍ය කාල , තත්‍ය කාල, ඒක පරිශීලක, බහු පරිශීලක

7. පහත කාර්යයන් සළකන්න.

A-වයිරස වලට එරෙහිව දත්ත සුරැකීම

B-ගබඩා කිරීමේ උපාංග වල ඇති ගොනුවල හා ඩිරෙක්ටරි වල ෆෝල්ඩර වල සටහන් තබා ගැනීම

C-තැටි ධාවක හා මුද්‍රක වැනි පර්යන්ත උපාංග පාලනය කිරීම

D-චිත්‍රක සැලසුම් සඳහා පහසුකම් සැපයීම

මේවායින් මෙහෙයුම් පද්ධතියක කාර්යයන් මොනවාද?

1) A,C පමණි

2) B,C පමණි

3) A,B,C පමණි

4) ඉහත සියල්ලම

8. මෙහෙයුම් පද්ධතිය

A-අතුරු මුහුණතක් සපයමින් දෘඩාංග හා පරිශීලකයා අතර ඇති හිඩැස සම්පූර්ණ කරයි

B-සන්නිවේදනය හා තොරතුරුවලට ප්‍රවේශය සඳහා පරිශීලකයාට අන්තර්ජාල පහසුකම් සපයා දෙයි

C-ගොනු හා ෆෝල්ඩර මෙහෙයවීම සිදු කරයි

ඉහත වගන්ති අතුරෙන් සත්‍ය වන්නේ

1) A,B පමණි

2) A,C පමණි

3) B,C පමණි

4) ඉහත සියල්ලම

9. ගොනුව සහ ගොනුවේ දිගුව සළකා බලමින් සාවද්‍ය වරණය තෝරන්න.

| ගොනුවේ දිගුව | ගොනු වර්ගය |
|---|---|
| A. exe | Executable |
| B. xlsx | Word |
| C. pptx | PowerPoint |
| D. accdb | Access |

1) A,D පමණි

2) B,C පමණි

3) B පමණි

4) A,D පමණි

10. මෙහෙයුම් පද්ධතියක ඇති උපයෝගිතා වැඩසටහන් මගින් පරිගණකයේ සුමට ක්‍රියාකාරිත්වය පවත්වාගෙන යාම මෙන්ම සමහර අවස්ථාවල ඇතිවන උපද්‍රව මගින් පරිගණකය ආරක්ෂා කිරීමද කරනු ලබයි. එවැනි උපයෝගිතා වැඩසටහන් දැක්වෙන වාරණයක් නොවන්නේ

උපස්ථ මෘදුකාංග, තැටි සුපරීක්ෂණය,තැටි ප්‍රතිභාගිකරණය

උපස්ථ මෘදුකාංග, පංගු සුපරීක්ෂණය,තැටි ප්‍රතිභාගිකරණය

තැටි මෘදුකාංග ,ආකෘතිකරණය,පද්ධති කළමනාකරණය

ෆෝල්ඩර,ගොනු,තැටි භාගිකරණය

පිළිතුරු

| | |
|---|---|
| 1) | 1 |
| 2) | 1 |
| 3) | 2 |
| 4) | 3 |
| 5) | 4 |
| 6) | 3 |
| 7) | 2 |
| 8) | 2 |
| 9) | 3 |
| 10) | 1 |